# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,478 — 1958 අගෝස්තු 20 වැනි බදාදා — 20.8.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**අංකය: ඇෆ්.සී./වී.ඇස්.ඇෆ් 7 (2) දරණ මිල නියෝගය.** **හරක්මස්**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සතරසිංහගේ දෙන් සුගතදස වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 4 වෙනි ඡෙදය හා 3 (2) වෙනි ඡෙදයෙන්ද මා කෙරෙහි පවරා ඇති බලතල අනුව—

(1) අංක 11,416 සහ 58.7.7 දින දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද මගේ අංක ඇෆ්.සී./වී.ඇස්.ඇෆ්.7(1) සහ 58.7.7. දින දරණ මිළ නියෝගය මෙයින් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛණයේ 2, 3, සහ 4 වෙනි තීරයන්හි සඳහන් මිළ මෙරට හරක්මස් රාත්තලක වැඩිම මිළ වශයෙන් වහාම ක්‍රියාත්මක වනසේ නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට හා ශ්‍රෙණිවලට අයත් මෙරට හරක්මස් එම උපලේඛණයේම 1 වෙනි තීරයේ සඳහන්කොට ඇති සීමාවන් ඇතුළත එකී මිලට වැඩියෙන් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍යය සඳහා—

(අ) "මෙරට හරක්මස්" යනුවෙන් හැඟවෙන්නේ ඇතිකරන ඉන්දියානු හෝ සිංහල ගවයන්ගේ හෝ මීහරකුන්ගේ මාංශයයි. බොකු, බඩවැල් ආදී සියලු ආකාර ඉවත්කරනු ලබන දය මීට ඇතුළත් නොවේ.

(ආ) සතෙකුගේ සිරුර විකිණීම සඳහා මස්මඩුවේ පිළියෙල කොට ඇති පරිදි (එනම් හිස, හම, බොකු, බඩවැල්, කුර සහ වෙනත් සියලු විධියේ සාමාන්‍යයෙන් ඉවත්කරනු ලබන දය අතහැර) විකුණනවිට "තනිබර අනුව" විකිණීමක් ලෙස සලකනු ලබන බවත්

මෙම නියෝගයෙන් නියම කරමි.

(4) කටු සහිත මෙරට හරක්මස් විකුණන කල්හි විකුණන මුළුබරින් සියයට 25කට වඩා කටුවල බර වැඩි නොවිය යුතුයි.

(5) මීට යා කර ඇති උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් තුල කිසියම් තැනක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ උපලේඛණයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් මෙරට හරක්මස් ඇති සෑම වෙළෙන්දෙකුම මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ, පැහැදිලිව පෙනෙන ලෙස තැබිය යුතුයි.

(6) "මෙරට හරක්මස්" විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා එළිදරව්වේ තැබිය යුත්තේ ඒ සඳහා වෙන්කොට ඇති වෙළඳ පිල්වල පමණකි. එම වෙළඳ පිල්වල වෙනත් වර්ගයක හෝ ශ්‍රෙණියක මස් විකිණීම හෝ විකිණීම සඳහා එළිදරව්වේ තැබීම නොකළ යුතුයි.

(7) මීට යාකර ඇති උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් තුල කිසියම් තැනක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ උපලේඛණයේ සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් "මෙරට හරක්මස්" ඇති සෑම වෙළෙන්දෙකුම එම වර්ගයට සහ ශ්‍රෙණියට අයත් මෙරට හරක්මස් පමණක් විකුණන බවට එම මස් විකුණන වෙළඳ පිලෙහි පැහැදිලිව පෙනෙන සේ දැන්වීමක් තැබිය යුතුයි.

(8) ඉවත්කරණු ලබන දය සමග මෙරට හරක්මස් එකම ගණුදෙනුවකදී විකුණනු ලබන විට මෙරට හරක්මස් ඉවත්කරනු ලබන දයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතු යි.

(9) සෑම වෙළෙන්දෙකුම මෙරට හරක්මස් විකුණන කල්හි, මෙ රට හරක්මස් ලබාගන්නාට සැබෑබර පහසුවෙන් බලාගැණීමට හැකිවනසේ බර කිරන තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.


2323—ජේ. ඇන්. ආර් 25623—5,299 (8/58)

(10) මීට යාකර ඇති උපලේඛණයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් මෙරට හරක්මස් විකුණන සෑම වෙළෙන්දෙකුම, මෙරට හරක්මස් ලබාගන්නකු ඉල්ලා සිටියවිට කුයිතාන්සියක් දිය යුතුයි. එම කුයිතාන්සියේ—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ මෙරට හරක්මස් ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ මෙරට හරක්මස්වල විස්තරය ; සහ

(ඈ) විකුණූ මෙරට හරක්මස් ප්‍රමාණයට ගෙවූ මුදලද

සඳහන් විය යුතුයි.

(11) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියමකරනලද සෑම ප්‍රදේශයක් තුළ, කිසිවකු උපලේඛණයේ සඳහන් දෑය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කලවම් කොට නොවිකිණිය යුතුයි.

(12) උප ලේඛණයේ සඳහන් දෑය විකුණන කල්හි, එකී දෑය ඔතා හෝ බහාලන කිසියම් ද්‍රව්‍යයක මිළක් වෙතොත් එය එම උපලේඛනයේ 2, 3, සහ 4 වෙනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(13) මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් හැඟවෙන්නේ ඇවර්දූපොයි බරක්‍රමය අනුව සම්මත රාත්තලේබර බවද නියම කරමි.

1958 අගෝස්තු 20 වෙනි දින පෙරවරු 8ට කොළඹ කච්චේරියේදී අත්සන්කරනලදී.

ඇස්. ඩී. සුගතදාස,
කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

## උපලේඛනය

### මෙරට හරක්මස් සඳහා වැඩිම මිළ

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>මෙරට හරක් මස් කටු රහිත රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. | 3 වෙනි තීරය<br>මෙරට හරක් මස් කටු සහිත රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. | 4 වෙනි තීරය<br>මෙරට හරක් මස් තනිබර අනුව රාත්තලක වැඩිම මිල<br>රු. ශ. |
|---|---|---|---|
| (1) හාපිටිගම් කෝරළය, අළුත්කුරු කෝරළය උතුර (ඒ), අළුත්කුරු කෝරළය උතුර (බී), අළුත්කුරු කෝරළය දකුණ, සියනෑ කෝරළය නැගෙනහිර, සියනෑ කෝරළය බස්නාහිර (අදිකාරිපත්තු), සියනෑ කෝරළය බස්නාහිර (මැදපත්තු), හේවාගම් කෝරළය සහ සල්පිටි කෝරළය (මොරටු පළාත් ආණ්ඩු සීමාවෙන් පිටත) | 0 80 ... | 0 65 ... | 0 55 |
| (2) මොරටු පළාත් ආණ්ඩු සභා සීමාව ඇතුලත ... ... ... | 0 90 ... | 0 75 ... | 0 65 |
| (3) කොළඹ ආදායම්පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශය (කොළඹ නාගරික සීමාවෙන් හා | 0 80 ... | 0 65 ... | 0 55 |
| දෙහිවල, ගල්කිස්ස පළාත් ආණ්ඩු සභා සීමාවෙන් පිටත) ... ... | 0 80 ... | 0 65 ... | 0 55 |
| (4) දෙහිවල-ගල්කිස්ස පළාත් ආණ්ඩු සභා සීමාව ඇතුලත ... ... | 0 95 ... | 0 80 ... | 0 70 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍ය විකිණිය නො හැකිය.

---

ඇෆ්. සී./වී.ඇස්. ඇෆ්1. (16) දරණ ආහාර මිළ නියෝගය — අතිරේක ආහාර ද්‍රව්‍ය.

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

කොළඹ දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන්පත් සතරසිංහගේ දොන් සුගතදාස වන මම, 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි ඡෙදයෙන් සහ එම පනතේ 3 (2) වෙනි වගන්තියෙන් දමා හට පැවරී ඇති බලතල අනුව—

(1) අංක 11,424 සහ 58. 7. 12 දින දරණ ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද මාගේ අංක ඇෆ්.සී./වී.ඇස්.ඇෆ් 1 (15) සහ 58. 7. 11 දින දරණ ආහාර මිළ නියෝගය මෙයින් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති ''ඒ'' උප ලෙඛනයේ 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් ද්‍රව්‍ය තොග වශයෙන් විකිණීමේ දී ද දළ බර හොණ්ඩරයක් එම උප ලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩිම මිළ එම උප ලෙඛනයේ අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යා කර ඇති ''බී'' උප ලෙඛනයේ 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් ද්‍රව්‍යයන් සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් එම උප ලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩිම මිළ එම උපලෙඛනයේ අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) මීට යාකර ඇති ''ඒ'' සහ ''බී'' උප ලෙඛනයන්හි 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් ද්‍රව්‍යයන් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ එම ''ඒ'' සහ ''බී'' උප ලෙඛනයන්හි 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් ද්‍රව්‍යයන් වරකට දළ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) එම ''ඒ'' සහ ''බී'' උප ලෙඛනයන්හි 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් ද්‍රව්‍යයන් පරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්

මෙම නියෝගයෙන් නියම කරමි.

(5) එසේම මේ මිළ නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම ''ඒ'' සහ ''බී'' උප ලේඛනයන්හි 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නො විකිණිය යුතු බව නියෝග කරමි.

(6) එසේම මේ මිළ නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම ''ඒ'' සහ ''බී'' උප ලේඛනයන්හි 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් යම් ද්‍රව්‍යයක් යම් ස්ථානයක හෝ යම් වාහනයක සියස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබා ගෙන සිටින සෑම වෙළෙන්දකුම එකී ද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ මිළ නියෝගයේ නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා ''රාත්තල්'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර් ඩූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව ද නියමකරමි.

(8) මේ මිළ නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයක ම ''ඒ'' උප ලේඛනයේ 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා ''බී'' උප ලේඛනයේ 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය බර අනුවයි ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුයිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(9) එසේම ''ඒ'' සහ ''බී'' උප ලේඛනයන්හි 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහාලනු ලැබේ නම් එහි මිළත් එම උපලේඛනයේ 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බව ද නියම කරමි.

1958 අගෝස්තු මස 20 වැනි දින පෙරවරු 8 ට කොළඹ කච්චේරියේ දී අත්සන් කරණ ලදී.

ඇස්. ඩී. සුගතදස,
(ආහාර) සහකාර මිළ පාලක,
කොළඹ දිස්ත්‍රික්කය.

## "ඒ" උප ලේඛණය

තොග වෙළෙඳුන් විසින් දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිල

| 1 වැනි තීරය ප්‍රදේශය | 2 වැනි තීරය ලූණු (රතු ලූණු හැර වෙනත් සියළුම වර්ගවල ලූණු) | 3 වැනි තීරය කොත්තමල්ලි | 4 වැනි තීරය සුදුරු | 5 වැනි තීරය වියලි මිරිස් | 6 වැනි තීරය මුං ඇට | 7 වැනි තීරය උලුඳු (පියලි නොකල) | 8 වැනි තීරය කඩල පරිප්පු | 9 වැනි තීරය මසූර් පරිප්පු | 10 වැනි තීරය රතුලූණු | 11 වැනි තීරය අර්තාපල් | 12 වැනි තීරය උම්බලකඩ | 13 වැනි තීරය අබ | 14 වැනි තීරය ලූණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 1. හාපිටිගම් කෝරළය | 21 35 | 41 97 | 123 87 | 78 72 | 47 22 | 49 08 | 41 76 | 62 97 | 26 70 | 30 70 | 258 27 | 72 97 | — |
| 2. අළුත්කුරු කෝරළය උතුර (ඒ) | 21 09 | 41 71 | 123 61 | 78 46 | 46 96 | 48 82 | 41 50 | 62 71 | 26 44 | 30 44 | 258 01 | 72 71 | — |
| 3. අළුත්කුරු කෝරළය උතුර (බී) | 21 03 | 41 65 | 123 55 | 78 40 | 46 90 | 48 76 | 41 44 | 62 65 | 26 38 | 30 38 | 257 95 | 72 65 | — |
| 4. අළුත්කුරු කෝරළය දකුණ | 20 83 | 41 45 | 123 35 | 78 20 | 46 70 | 48 56 | 41 24 | 62 45 | 26 18 | 30 18 | 257 75 | 72 45 | — |
| 5. සියනෑ කෝරළය නැගෙනහිර | 21 15 | 41 77 | 123 67 | 78 52 | 47 02 | 48 88 | 41 56 | 62 77 | 26 50 | 30 50 | 258 01 | 72 77 | — |
| 6. සියනෑ කෝරළය බස්නාහිර (අධිකාරිපත්තු) | 20 81 | 41 43 | 123 33 | 78 18 | 46 68 | 48 54 | 41 22 | 62 43 | 26 16 | 30 16 | 257 67 | 72 43 | — |
| 7. සියනෑ කෝරළය බස්නාහිර (මැද පත්තු) | 20 91 | 41 53 | 123 43 | 78 28 | 46 78 | 48 64 | 41 32 | 62 53 | 26 26 | 30 26 | 257 77 | 72 53 | — |
| 8. හේවාගම් කෝරළය | 20 99 | 41 61 | 123 51 | 78 36 | 46 86 | 48 72 | 41 40 | 62 61 | 26 34 | 30 34 | 257 85 | 72 61 | — |
| 9. සල්පිටි කෝරළය | 20 91 | 41 53 | 123 43 | 78 28 | 46 78 | 48 64 | 41 32 | 62 53 | 26 26 | 30 26 | 257 77 | 72 53 | — |
| 10. කොළඹ ආදායම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශය (කොළඹ නාගරික සීමාවෙන් පිට) | 20 75 | 41 37 | 123 27 | 78 12 | 46 62 | 48 48 | 41 16 | 62 37 | 26 10 | 30 10 | 257 69 | 72 37 | — |

සැලකිය යුතුයි.—ඉහත සඳහන් මිල ගණන් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිල නොවේ. ඒවා, ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි වැඩිම මිල ගණන්ය.

## "බී" උප ලේඛණය

සිල්ලර වෙළෙඳුන් විසින් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල

| 1 වැනි තීරය ප්‍රදේශය | 2 වැනි තීරය ලූණු (රතු ලූණු හැර වෙනත් සියළුම වර්ගවල ලූණු) | 3 වැනි තීරය කොත්තමල්ලි | 4 වැනි තීරය සුදුරු | 5 වැනි තීරය වියලි මිරිස් | 6 වැනි තීරය මුං ඇට | 7 වැනි තීරය උලුඳු (පියලි නොකල) | 8 වැනි තීරය කඩල පරිප්පු | 9 වැනි තීරය මසූර් පරිප්පු | 10 වැනි තීරය රතුලූණු | 11 වැනි තීරය අර්තාපල් | 12 වැනි තීරය උම්බලකඩ | 13 වැනි තීරය අබ | 14 වැනි තීරය ලූණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 1. හාපිටිගම් කෝරළය | 0 23 | 0 41 | 1 21 | 0 76 | 0 46 | 0 48 | 0 41 | 0 61 | 0 29 | 0 32 | 2 51 | 0 71 | 0 06 |
| 2. අළුත්කුරු කෝරළය උතුර (ඒ) | 0 23 | 0 41 | 1 21 | 0 76 | 0 46 | 0 48 | 0 41 | 0 61 | 0 29 | 0 32 | 2 51 | 0 71 | 0 06 |
| 3. අළුත්කුරු කෝරළය උතුර (බී) | 0 23 | 0 41 | 1 21 | 0 76 | 0 46 | 0 48 | 0 41 | 0 61 | 0 29 | 0 32 | 2 51 | 0 71 | 0 06 |
| 4. අළුත්කුරු කෝරළය දකුණ | 0 23 | 0 41 | 1 21 | 0 76 | 0 46 | 0 48 | 0 41 | 0 61 | 0 29 | 0 32 | 2 51 | 0 71 | 0 06 |
| 5. සියනෑ කෝරළය නැගෙනහිර | 0 23 | 0 41 | 1 21 | 0 76 | 0 46 | 0 48 | 0 41 | 0 61 | 0 29 | 0 32 | 2 51 | 0 71 | 0 06 |
| 6. සියනෑ කෝරළය බස්නාහිර (අධිකාරිපත්තු) | 0 23 | 0 41 | 1 21 | 0 76 | 0 46 | 0 48 | 0 41 | 0 61 | 0 29 | 0 32 | 2 51 | 0 71 | 0 06 |
| 7. සියනෑ කෝරළය බස්නාහිර (මැද පත්තු) | 0 23 | 0 41 | 1 21 | 0 76 | 0 46 | 0 48 | 0 41 | 0 61 | 0 29 | 0 32 | 2 51 | 0 71 | 0 06 |
| 8. හේවාගම් කෝරළය | 0 23 | 0 41 | 1 21 | 0 76 | 0 46 | 0 48 | 0 41 | 0 61 | 0 29 | 0 32 | 2 51 | 0 71 | 0 06 |
| 9. සල්පිටි කෝරළය | 0 23 | 0 41 | 1 21 | 0 76 | 0 46 | 0 48 | 0 41 | 0 61 | 0 29 | 0 32 | 2 51 | 0 71 | 0 06 |
| 10. කොළඹ ආදායම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශය (කොළඹ නාගරික සීමාවෙන් පිටත) | 0 22 | 0 40 | 1 20 | 0 75 | 0 45 | 0 47 | 0 40 | 0 60 | 0 28 | 0 31 | 2 50 | 0 70 | 0 06 |

සැලකිය යුතුයි.—ඉහත සඳහන් මිල ගණන් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිල නොවේ. ඒවා ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි වැඩිම මිල ගණන්ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.